# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 2018.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවා ගාස්තු සහ කොන්ත්‍රාත් ගෙවීම් වලින් රඳවාගැනීමේ බදු අඩුකිරීම.

### 1. රඳවාගැනීමේ බද්දට යටත්වන ගෙවීම් සහ අදාළ වන බදු අනුප්‍රමාණ

i. යම් තැනැත්තෙකු (රඳවාගැනීමේ අනුයෝජිතයෙකු) විසින් වාසික පුද්ගලයෙකු වෙත සිදු කරන පහත සඳහන් යම් සේවා ගාස්තුවක් හෝ කොන්ත්‍රාත් ගෙවීමක් - බදු අනුප්‍රමාණය 5% කි.

(අ) ඉගැන්වීම, දේශන පැවැත්වීම, විභාගයක් පරීක්ෂා කිරීම, නිරීක්ෂණය කිරීම හෝ අධීක්ෂණය කිරීම වෙනුවෙන් කරන ගෙවීමක්;

(ආ) වාසික පුද්ගලයෙකු වන රක්ෂණ, අලෙවි හෝ තැරැව් අනුයෝජිතයෙකු වෙත ගෙවනු ලබන කොමිස් මුදලක් හෝ බ්‍රෝකර් ගාස්තුවක්;

(ඇ) සහතික කිරීමේ ගාස්තුවක්;

(ඈ) ටෙන්ඩර් හෝ මිළ නියම කිරීම මගින් කොන්ත්‍රාත්තු පදනමින් යම් භාණ්ඩයක් සැපයීමට අදාළව කරනු ලබන ගෙවීමක්;

(ඉ) වෛද්‍ය, ඉංජිනේරු. ගණකාධිකාරී, නීතිඥ, මෘදුකාංග සංවර්ධනකරුවන්, පර්යේෂකයින්, විද්‍යාර්ථීන් වැනි වෘත්තීන්හි නිදහස් සේවා සපයන්නන් ලෙස සපයන ලද යම් සේවාවන් හෝ වෙනත් ඒ හා සමාන යම් සේවාවක් සැපයීම සඳහා කරන ලද ගෙවීමක්;

(ඊ) ගිවිසුමක් යටතේ හෝ එසේ ගිවිසුමක් නොමැතිව සපයන්නා වූ ඉදිකිරීම් කටයුතු සම්බන්ධ සේවා, ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා, යම් ආකාරයක උපදේශන සේවා, උත්සව අවස්ථා සංවිධානය, කෑම බීම සංග්‍රහ කටයුතු, මෝස්තර නිර්මාණය, ඇඳුම් සැකසීම, සංචාර මාර්ගෝපදේශනය, විනෝදාස්වාදය, නියෝජිත කාර්යයන් හෝ ඒ හා සමාන කටයුතු සඳහා කරනු ලබන ගෙවීමක්;

(උ) යම් කළමනාකරණ සේවාවක් සඳහා කරනු ලබන ගෙවීමක්;

(ඌ) නිදහස් සේවා සපයන්නෙකු ලෙස සැපයෙන යම් ආකාරයක වෘත්තීමය සේවාවක් සඳහා කරනු ලබන ගෙවීමක්;

**සටහන**

- ගෙවීම් කරන්නා යම් තැනැත්තෙකු වී ගෙවීම් ලබන්නා වාසික පුද්ගලයෙකු වන අවස්ථාවකදී පමණක් රඳවාගැනීමේ බදු අඩු කළ යුතුය. මෙහි තැනැත්තා යන්නට පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක්, සමාගමක්, භාරයක්, සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක්, පොල්මෑකරුවෙක්, රාජ්‍ය නොවන සංවිධානයක්, පුණ්‍යායතනයක්, සංස්ථාගත නොකළ සංගමයක්, මිත්‍රශීලී සමිතියක්, ගොඩනැගිලි සමිතියක්, විශ්‍රාම වැටුප් අරමුදලක්, අර්ථසාධක අරමුදලක්, විශ්‍රාම අරමුදලක්, විශ්‍රාම පාරිතෝෂික අරමුදලක් හෝ ඒ හා සමාන අරමුදලක් හෝ සමිතියක්, රාජ්‍ය සංස්ථාවක්, මණ්ඩලයක් හෝ අධිකාරියක් ඇතුළත් වන නමුදු ශ්‍රී ලංකා ආණ්ඩුව ඇතුළත් නොවේ.

- යම් පුද්ගලයෙකුට මසකට කරන ලද ගෙවීම් වල එකතුව රු. 50,000/- (එකතු කිරීමේ අගය මත බදු ඇතුළත් නොවූ වටිනාකම) නොඉක්මවන්නේ නම් රඳවාගැනීමේ බදු අඩුකිරීම අවශ්‍ය නොවේ.

ii. යම් තැනැත්තෙකු (රඳවාගැනීමේ අනුයෝජිතයෙකු) විසින් යම් නිර්වාසික තැනැත්තෙකු වෙත ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිතව ගෙවනු ලබන යම් සේවා ගාස්තුවක් හෝ රක්ෂණ වාරික මුදලක් - බදු අනුප්‍රමාණය 14% කි.

අදාළ ද්විත්ව බදුකරණ ගිවිසුමේ නියම කර ඇති උපරිම සීමාවන්ට යටත්ව මෙම බදු අනුප්‍රමාණය යොදාගත යුතුය. අවශ්‍ය වන්නේ නම්, මෙවැනි අවස්ථාවන්හි දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජාත්‍යන්තර බදු අංශයෙන් අදාළ බදු අනුප්‍රමාණ පිළිබඳව තහවුරු කිරීමක් ලබා ගත හැක.

iii. යම් තැනැත්තෙකු (රඳවාගැනීමේ අනුයෝජිතයෙකු) විසින්, ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිතව ප්‍රවාහන ව්‍යාපාරයක් (ගොඩබිම්, මුහුදු හෝ ගුවන්) හෝ විදුලි සංදේශ සේවා සම්බන්ධ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන නිර්වාසික තැනැත්තෙකු වෙත කරනු ලබන ගෙවීමක් - බදු අනුප්‍රමාණය 2% කි.

### 2. රඳවාගැනීමේ බද්දට යටත් නොවන ගෙවීම්

i. 83 වන වගන්තිය යටතේ රඳවාගැනීමට යටත් ගෙවීම්.(සේවා නියුක්ති ආදායම)

ii. ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී මිස, පුද්ගලයන් විසින් කරනු ලබන ගෙවීම්.

iii. රඳවාගනු ලැබීමට යටත් වන පුද්ගලයා විසින් අදාල ලැබීමට ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වන යම් ආකාරයක සේවා ගාස්තු ගෙවීම් හෝ කොන්ත්‍රාත් ගෙවීම්;

iv. නිදහස් කළ ප්‍රමාණ වන ගෙවීම්;

* රඳවාගනු ලැබීමට යටත් වන්නෙකු (iii) හෝ (iv) ඡේදයන්හි සඳහන් නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති බව තහවුරු කරගනු පිණිස, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, පාරිභෝගික සහාය සහ ප්‍රවර්ධන ඒකකය හෝ අදාළ ප්‍රාදේශීය කාර්යාලය විසින් නිකුත් කළ සහතිකයක්, එවැනි රඳවාගනු ලැබීමට යටත් වන්නෙකුගෙන් ලබාගැනීමට රඳවාගැනීමේ අනුයෝජිතයා කටයුතු කළ යුතුය.



### 3. ලියාපදිංචිවීම

සෑම රඳවාගැනීමේ අනුයෝජිතයෙකු විසින්ම යම් රඳවාගනු ලැබීමට යටත් වන්නෙකුගෙන්, රඳවාගැනීමේ බදු අඩුකර ගැනීමේ කර්තව්‍යය සඳහා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු වර්ග ලියාපදිංචි කිරීමේ අංශයෙන් හෝ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකින් ලියාපදිංචි අංකයක් ලබාගත යුතුය. බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් දැනටමත් ලබාගෙන නොමැති රඳවාගැනීමේ අනුයෝජිතයෙකු ප්‍රථමයෙන්, මූලික ලියාපදිංචි ඒකකයෙන්, බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබාගත යුතුය.

### 4. රඳවාගැනීමේ බදු ගණනය කිරීම

ඉන්වොයිස් වටිනාකමෙහි දළ මුදල් ප්‍රමාණය මත රඳවාගැනීමේ බදු අඩු කළ යුතුය. (එකතු කිරීමේ අගය මත බදු හැර අනෙකුත් සියළුම බදු ඇතුළත් වටිනාකම මත)

### 5. රඳවාගනු ලැබූ බදු ගෙවීම

රඳවාගැනීමේ අනුයෝජිතයෙකු විසින් එක් එක් ලිත් මාසයක් අවසන් වීමෙන් පසු දින 15 ක් තුළ, අදාළ ලිත් මාසය තුළ දී රඳවාගන්නා ලද බදු මුදල කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතුය. (ලාභාංශ සම්බන්ධ රඳවාගැනීමේ බද්දක් වන විට ලංකා බැංකුවේ ගිණුම් අංක 20266527 ට ද, අනිකුත් සියළුම ගෙවීම් සම්බන්ධ රඳවාගැනීමේ බද්දක් වන විට මහජන බැංකුවේ ගිණුම් අංක - 014-1002-6-9026620 ටද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ගෙවීම් පත්‍රිකා භාවිතා කරමින්)

### 6. බදු අඩුකිරීමේ සහතිකය

රඳවාගැනීමේ අනුයෝජිතයෙකු විසින් යම් රඳවාගනු ලැබීමට යටත් වන්නෙකුගෙන් රඳවාගැනීමේ බද්දක් අඩුකරන අවස්ථාවකදී බදු අඩුකිරීම් සහතිකයක් නිකුත් කළ යුතුය. එම සහතිකයෙන් ලිත් මාසයක බදු අඩුකිරීම් ආවරණය විය යුතු අතර මාසය අවසානයේ සිට දින 30 ක් ඇතුලත එය භාරදිය යුතුය.

### 7. වාර්තා සහ උපලේඛන ඉදිරිපත් කිරීම

i. **වාර්තා**

සෑම රඳවාගැනීමේ අනුයෝජිතයෙකු විසින් සෑම තක්සේරු වර්ෂයක් සඳහාම වර්ෂය අවසානයෙන් පසු දින 30 ක් තුළ (අප්‍රේල් 30 වන දින හෝ ඊට පෙර), දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් සඳහන් කර ඇති පරිදි වාර්ෂික ප්‍රකාශන ගොනු කළ යුතුය. ලියාපදිංචි වී ඇති සෑම රඳවාගැනීමේ අනුනියෝජිතයෙකු විසින්ම කිසිදු බද්දක් ගෙවීමට නොමැති අවස්ථාවකදී වුවද වාර්ෂික ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතුය.

ii. **උපලේඛන**

රඳවාගැනීමේ බදු අඩු කරන ලද ගෙවීම් සඳහා සහ රඳවාගැනීමේ බදු අඩු නොකරන ලද ගෙවීම් සඳහා වෙන වෙනම උපලේඛන අදාළ ආකෘතිය භාවිතා කරමින්, සකස් කර වාර්ෂික ප්‍රකාශනය සමග ඉදිරිපත් කළ යුතුය.

**වැඩිදුර පැහැදිලි කරගැනීම් සඳහා අමතන්න :**

කොමසාරිස් (රඳවාගැනීම් බදු) - 0113009468
ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (රඳවාගැනීම් බදු) - 0112134960
ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (බදු ප්‍රතිපත්ති) - 0112135410
නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්( රඳවාගැනීම් බදු) - 0112134400
නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්(බදු ප්‍රතිපත්ති) - 0112135402

**අදාළ චක්‍රලේඛ, බදු අඩුකිරීමේ සහතිකවල ආදර්ශ සහ අදාළ උපලේඛන බාගත කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. www.ird.gov.lk**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

**බදු - වඩා හොඳ අනාගතයකට**